**ගාලු උරුමය පදනම - 2015**

----------------------------------

ගාලු උරුමය පදනමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනතේ 13(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගාලු උරුමය පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පදනම වෙත ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබූ අතර, වාර්ෂිකව ලැබෙන ප්‍රදානයන් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. මෙම ප්‍රදානයන් උපයෝගී කරගෙන අත්පත් කරගෙන තිබූ ජංගම නොවන වත්කම් ක්ෂය කිරීමෙන් එහි අගය අඩුවී තිබුණ ද එම ප්‍රමාණයන් ප්‍රදානයන්ගෙන් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගාලු කොටුවේ පිහිටි ඔරලෝසු කණුවේ හා සණ්ඨාර කුළුනේ සංරක්ෂණ පිරිවැය වූ රු.15,048,677 ක් ගිණුම් තුල වත්කම් ලෙස ඇතුලත්ව ඇති නමුත් එම කුළුනුවල හිමිකාරත්වය සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය රු. 2,090,324 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,760,366 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 329,958 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙයට අතිරේකව සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු පදනමේ දායකත්වයෙහිද අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණි.මෙම වර්ධනය කෙරෙහි අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රදාන රු. 1,000,000 වැඩිවීම, ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 පදනමට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

2011 වර්ෂයේදී තාවකාලිකව බඳවාගත් සේවිකාවක් සේවයෙන් ඉවත් කිරීමෙන් පසුව ඇය නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පදනමට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් ගොනුකර තිබූ නමුත් මේ සම්බන්ධව ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි. මෙම නඩුව වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 වන විට නීතිඥ ගාස්තු වශයෙන් පදනම විසින් රු. 84,000 ක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත්කර නොතිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ගාලු කොටුවේ ඇති මූන් බැස්ටියන් ගැලරිය 2014 අවසන් කාර්තුව තුළ සංචාරකයින් සඳහා විවෘත කිරීමට සැලසුම් කර තිබුණද 2016 මාර්තු වන විටත් එය විවෘත කර නොතිබීම නිසා වසරකට වැඩි කාලයක් තිස්සේ ආදායම් උපයා ගැනීමට අවශ්‍ය කටයුතු නොකර වසා දමා තිබුණි.

3.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2013 වර්ෂයෙන් පසු භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

4.1 **කාර්යසාධනය**

-----------------

1994 අංක 7 දරන ගාල්ල උරුමය පදනම පනතේ 3 වන වගන්තියේ දැක්වෙන පදනමේ අරමුණු පහත දැක්වේ.

- ඓතිහාසික නගර මධ්‍යස්ථානයක් ලෙස ද පුරා විද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ද ගාල්ල කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම.

- ගාල්ල කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුලත පිහිටියා වූ ද ඓතිහාසික, සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති වූ ද යම් නිශ්චල හා චංචල දේපළක් අත්කර ගැනීම, දැරීම, පවත්වාගෙන යාම සහ බැහැර කිරීම.

- ගාල්ල කොටුව හා එහි ඓතිහාසික පසුබිම ඇතුලත පිහිටි නිවාස, ගොඩනැගිලි සහ වෙනත් දේපල සංරක්ෂණය කිරීමෙහිලා ගාල්ල කොටුව තුළ පදිංචි කරුවන්ගේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම.

- ගාල්ල කොටුව සහ එහි ඓතිහාසික පසුබිම පශ්චාත් භූමියට අතුළු වී එහි සිරි නැරඹීම සඳහා පහසුකම් සැලැස්වීම.

- ගාල්ල කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය තුළ පදිංචි කරුවන්ගේ සාමාන්‍ය සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

- ඉහත කී අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

ඉහත අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණයේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව තිබූ දෙස් විදෙස් සංචාරකයින් හා අබාධිතයන් සඳහා වැසිකිළියක් ඉදිකිරීම වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි.

(ආ) ගාල්ල කොටුව තුළ පිහිටි පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු හේතුවෙන් ගාල්ල උරුමය පදනමේ කාර්යාලය 2012 දෙසැම්බර් මස සිට මසකට රු. 30,000 බැගින් කුලී ගෙවමින් ගාල්ල කොටුවෙන් බැහැරව කි.මී 2 ක් පමණ දුරින් පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලකට ගෙනගොස් තිබුණි. ගාල්ල කොටුව තුළ අනවසර ඉදිකිරීම් නිරීක්ෂණය, පදිංචි කරුවන්ගේ පැරණි නිවාස සහ රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි සංරක්ෂණ ගැටළු විසඳීම, සංචාරකයන්ට පහසුකම් සැලසීම හා තොරතුරු සන්නිවේදනය වැනි කටයුතු ඉටු කිරීමේ දී පදනමට එය බාධාවක්ව පැවතුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමට වැඩි බලතල හිමිකර ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම යන අරමුණු සඳහා 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද 2016 මාර්තු මාසය වන විටත් එම පනතේ සංශෝධන කටයුතු සිදුවී නොතිබුණි.

(ආ) 2010 ජනවාරි සිට 2016 මාර්තු දක්වා කාලය තුල ගාල්ල කොටුව තුල අනවසර ඉදිකිරීම් හා පුරාවිද්‍යා ස්මාරක හානි සිදුවීම් 70 ක් වාර්තා වී තිබුණි. මේ සඳහා රු. 50,000 සිට රු. 500,000 දක්වා දඩ නියම කළ අවස්ථා 50 ක් පමණ නිරීක්ෂණය වූ අතර අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පදනමට නීතිමය ප්‍රතිපාදන නොමැති වීම හා සෙසු රාජ්‍ය ආයතන ඒ සඳහා කඩිනමින් යොමු කිරීමේ හැකියාව අවම මට්ටමක පැවතීමෙන් පදනම ස්ථාපිත කරන ලද පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා එය බාධාවක්ව පැවතුණි.

(ඇ) 2015 මුල් කාර්තුවේදී සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් යුනෙස්කෝ සංවිධානය වෙත ලෝක උරුම ගාලු කොටුව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සංරක්ෂණ සැලසුම් හා ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීමට අදාලව පදනම වෙත පැවරී ඇති කාර්යභාරය, වගකීම් හා පදනමේ සිදුකළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් පදනම විසින් පැහැදිලි දැක්මකින් යුතුව කටයුතු කර නොතිබුණි.

(ඈ) 17 වන සියවසේ මුල් අවධියට අයත් ගාලු කොටුවේ පිහිටි තැපැල් කාර්යාල ගොඩනැගිල්ලේ වර්ග අඩි 1500 ක පමණ සංරක්ෂණය නොකළ කොටසේ වහලය වර්ෂ 05 ක පමණ සිට සම්පූර්ණයෙන් දිරාපත් වී තිබුණි. මෙම ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපනශාලාවක් බදු දීම සඳහා ප්‍රසම්පාදන තීරණය 2015 ජුනි 24 දින ගෙන තිබූ නමුත් බදු ගිවිසුම අත්සන් කිරීම සඳහා මාස 02 ක් ප්‍රමාද වීම නිසා එම කාලය තුළ ලැබිය යුතු රු. 100,000 ක බදු කුලී පදනමට අහිමි වී තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව මාසික බදු කුලිය නොගෙවීම නිසා 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 209,200 ක කුලී මුදලක් ද අයවීමට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පළමු මාස 8 තුළ රු. 3,500,000 ඉක්ම වූ ශේෂයක් ද , ඉතිරි මාස 4 තුළ රු. 7,500,000 ඉක්ම වූ ශේෂයක් ද ඉතිරිකිරීමේ ගිණුමක අඛන්ඩව පවත්වාගෙන ගොස් තිබුණි. මෙම මුදල් එම බැංකුවේම ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කළේනම් රු. 72,000 ක පමණ අමතර පොලී ආදායමක් උපයා ගැනීමේ හැකියාව පිළිබඳව පදනමේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

ගාලු උරුමය පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 06 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයට අයත් පදනමේ අධ්‍යක්ෂ තනතුර සඳහා 2007 අප්‍රේල් 11 දින සිට විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරයෙක් ද පරිපාලන නිලධාරී තනතුර සඳහා 2006 ජනවාරි 03 සිට විශ්‍රාමික නිලධාරිනියක් ද වාර්ෂිකව කාලය දීර්ඝ කරමින් පත්කර තිබුණි. මෙම පත්කිරීම් හා පදනමේ පවතින පුරප්පාඩු හේතුවෙන් සංරක්ෂණ ව්‍යාපෘති සහ නව ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හා අනුමත කලමණාකරන සැලැස්මට අනුගතවීම ප්‍රමාද වීම ඇතුළු පදනමේ අරමුණු කරා ළඟා වීමේ දී ගැටළු මතු වී තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**අභ්‍යන්තර විගණනය**

------------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ද සමාලෝචිත වර්ෂය තුලදී විගණනයක් සිදුකර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) **ආදායම් රැස්කිරීම**

බලපත්‍ර සඳහා ගාස්තු අයකිරීම, යුධ කාමර බදු කුලී අය කිරීම හා ආපනශාලා කුලී අය කිරීමවැනි ආදායම් රැස් කිරීම් යාවත්කාලීන කිරීම.

(ආ) **ගිණුම්කරණය**

දේපල පිරියත හා උපකරණ වාර්ෂික ක්ෂය ගිණුම් තැබීම හා වත්කම් ප්‍රත්‍යාගණනය වාර්තා කිරීම යාවත්කාලීන කිරීම.

(ඇ) **ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

යුධ කාමර බදු දීම, ආපන ශාලාව බදු දීම වැනි ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීම.

(ඈ) **ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය**

යුනෙස්කෝ සංවිධානය විසින් අනුමත කර ඇති කළමනාකරණ සැලැස්මට අනුරූපව පදනමේ ප්‍රතිසංවිධාන කටයුතු කඩිනම් කිරීම.